*25 වන පිටුවෙන් (තරංගා)*

ඉගෙනීමේ කටයුතු ගැන අහපු වෙලාවෙදියි. දෙමව්පියන්ගේ සහයෝගයෙන් ඒ අය ඉහළින් මඅගය කළා. ඊ ළඟට අපි හැරුණෙ කණිෂ්ක දිහාට.

"මම ගිටාර් එක පටන් ගත්තෙ අවුරුදු පහේදී විතර. දෙමව්පියො තමයි මාව යොමු කළේ. ප්‍රාථමික, වගේම ද්වීතියික පාසල්වලදීත් මම එක විදියටම ගිටාර් එක ඉගෙන ගැනීම කරගෙන ගියා. ඒ.එම්.ඊ.බී. විභාගයත් සමත්. ඒක හරි අපූරුයි. හැමෝම එක වගේ. එකට කරනවා. හැමෝම තමන් කරන දේ ආසාවෙනුයි කරන්නෙ."

"කැමරන් අංකල් හැමදෙයක්ම ක්ෂණිකව ග්‍රහණය කරගන්න. සින්දු වල දේවල් වගේම අපි කරන වැරදි වුනත් එක පාරටම අල්ලාගෙ න කියලා දෙනවා. මමත් කනට හුරුවට ගොඩක් දේවල් කරනවා. හැම සටහනක්ම ලියනවාට වඩා ඒක හොඳයි. මම වාදනය කරන්නෙ රිදම් ගිටාර් එක. ක්ලැසිකල් වුණත් පුළුවන්. තනිවම ගහන "සෝලෝ" ත් එහෙමයි. ඒවා අනුබද්ධිත වික්ටෝරියන් කොලේජ් ආර්ට්ස් ආයතනයේ සංගීතය පිළිබඳව උපාධිධාරීයෙක්. වීණාත්, දිලිනිත් දැනට විශ්ව විද්‍යාලවල වෙනත් විෂය ධාරාවන් හදාරන විද්‍යාර්ථීන්. නවීන් තවම පාසල් දරුවෙක්.

"මනරංජිනී, කලිඳු, රෝහිත ඩ්‍රම්ස්, තබ්ලා පැත්ත බලා ගන්නවා. අපිත් එක්ක ඉන්න ක්‍රිස්ටි අමරනාත්ගේ හැකියාවන් දැනීමත් හරි පුදුම එකක්. මට හිතා ගන්නත් බෑ. කුමාර කරුණාතිලකගෙන් ලැබෙන සහයෝගයක් කියලා නිම කරන්න බෑ." කැමරන් තමන්ගෙ පරිවාර මියැසි බලමුළුවේ ඉතිරි අය ගැන කතා කෙලේ ආඩම්බරයෙන්. මනරංජන හෙට්ටිආරච්චි "ඔක්ටො පෑඩ්" වාදනයෙන්ද, කලිඳු වීරසිංහ තාල වාද්‍ය කට්ටලය නැතහොත් ඩ්‍රම්ස් වාදනයෙන්ද, රෝහිත උඩවෙල කාල තරංග නැතහොත් තබ්ලා, ඩොල්කි වාදනයෙන්ද "තරංගා" තරංග රිද්ම ගන්වනවා. කුමාර බේස් ගිටාරයෙන්ද ක්‍රිස්ටි සර පුවරුව නොහොත් කී බෝඩ් එකෙන් ද ඊට මුහුවෙනවා.

ප්‍රවීන ජ්‍යේෂ්ඨ සංගීතවේදී ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගෙන් හා විමල් ජේ. ශ්‍රිහාරත්නයන්ගෙන් තාල තරංග වාදනය ප්‍රගුණ කළ රෝහිත සිංහල ගී වාදනයේදී අත්‍යාවශ්‍යම සාමාජිකයෙක්. ප්‍රවීන සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගේ පුත් කලිඳු තම උපන් හපන්කම් "තරංගා" අතරට ගෙන එන්නේ ස්වකීය අධ්‍යාපන කටයුතුත් කැන්බරා නුවර රැකියාවත් කරන අතරෙයි. මනරංජන වාදනයට මෙන්ම ගායනයට දස්කම් දක්වන සාමාජිකයෙක්.

"අපේ නිත්‍ය ගායන ශිල්පිනිය, අසුන්තා කරුණාරත්න මුල්ම ගායන ශිල්පිනිය චම්පා, වාද්‍ය ශිල්පී ඒඩ්‍රියන් දුනුවිල, ඒ වගේම හිටපු සාමාජිකයන් වුණ අසංග ගුණරත්න, රවී කුමාරසිංහ වගේ අය ගැනත් අපි මතක් කරන්න ඕන."

"අපි අතරෙ ඉන්න දක්ෂ ළමයි එකතු කරලා වේදිකාවක ඒ අයගේ දක්ෂකම් පෙන්වන්න පුළුවන් විදිහෙ ප්‍රසංගයක් කරන එක තමයි මගේ ලොකුම ආසාව. එදාට තමයි මට සතුට වෙන්න පුළුවන්" කැමරන් කිව්වෙ හැඟීම්බරව. සංක්‍රමණික අපගේ දෙවැනි පරම්පරාවට සිය ලෙයින් උරුම කරගත් හපන්කම් ඔපකරවීමේ සද්කාර්යයට කැප වී සිටි "තරංගා" පිළිබඳව පිටු පුරා ලියන්නට අප නිර්ලෝභීවන්නේත් ඒ හේතුවෙන් නිසා ම නොවේද ?

ඉතින් විසිවන විය සපුරන "තරංගා" මියැසියේ නළලත සිප පතමු අපි ඇයට අපගෙ සුභාශිංසන !

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

*15 වන පිටුවෙන් (අදිසි)*

අහිංසකයකු බව අයෝමා ද දනියි. අයෝමාට ඔහු අවසන් වරට හමු වූයේ පෙරේදා ය. සුපුරුදු ලෙසින් පොඩිවී ගිය කමිසයත් එල්ලා වැටෙන කලිසමත් අවුල් වූ කොණ්ඩයත් ඔහුට එක් කර තිබුණේ දුක්මුසු පෙනුමකි. ඔහු කෙරෙන් දිස් වන විඩාපත් බව අගේ සිත කම්පනයට පත් කළේ ය.

"අම්ම දන්නව නම් වහ කයි.." ඔහු කී සැටි ඇයට මතක ය.

"මේ අවුරුදු දෙක තුන ඉවර කළාට පස්සෙ සමාජයට ගියාම මේ අද අපි කරන දේවල් මහා විහිලු වගේ ජේන එක වළක්වන්න බැහැ තිළිණ.. සමාජයෙ යමක් කරන්න පුලුවන් තැන් වලට අවසානෙදි යන්නෙ මෙතනින් උපාධි ගන්න අය.. ඒ අය මෙතනදි කරන කියන දේවල් ප්‍රගතිශීලී අදහස් විශ්ව විද්‍යාල ගේට්ටුවෙන් ඇතුල් පැත්තෙ තියලයි එළියට යන්නෙ.. මේ පෙන්වන ප්‍රගතිශීලී බවෙන් එක දශමයක් හරි සමාජයට ගෙනියනව නම් අපේ සමාජය සුනිමල සුපිරිසිදු තැනක් වෙලා හුඟක් කල්.. අද අපි කරන්නෙ එක එක්කෙනාගෙ හිඩ්න් අජෙන්ඩාස් වෙනුවෙන් කඩේ යන එක විතරයි තිළිණ.."

තිළිණ කතාවකින් තොරව තේ වීදුරුව තොල ගායි. ඔහු අසා සිටින බව අයෝමා දනියි.

"අරගල කරනවා නම් විශ්ව විද්‍යාලය ඇතුලෙම කොයි තරම් දේ තියෙනව ද..? ක්ලාස් එකක් ගහන්න නම් ලෙක්චරර් එක්ක බුදියගන්න වෙන තැනට අද ඇවිත්.. කවුද ඒව ගැන කතා කරන්නෙ..? කසාය බීලු ගොලුවො වගේ හැමෝම නිශ්ෂබ්දයි.."

"මට මේ හැම දේම දමල ගහලා ගමේ යන්න හිතෙනවා අයෝ.." තිළිණ බොහෝ වේලාවකට පසුව කියයි.

"ඇයි..?"

"අම්මට තවත් බර දෙන්න බැහැ… මෙහෙම රස්තියාදු වෙවී කාලෙ කන්න හිතෙන්නෙ නැහැ.. මං මේ නාස්ති කරන්නෙ අම්මගෙ දාඩිය මහන්සිය"

"කොහොම හරි ගොඩවෙන්න බලමු.. "

"මං හිතන්නෑ.. සමාවක් ලැබෙන පාටක් නෑ.. අධ්‍යාපනය කඩාකප්පල් කරගත්ත මිනිහෙක් හැටියට ගමට මූණ දෙන්නත් බෑ.. මොනා කරගන්නද මන්දා.."

"විනය පරීක්ෂණ වලින් වරදකාරයා වුණ හැමෝගෙම අධ්‍යාපනය කඩාකප්පල් වුණේ නැහැනෙ.. හුඟක් අයට ආපහු සමාව ලැබුණානෙ.."

"ඒව කරගන්න මට හයියක් නෑ අයෝ.. අඩුමගානෙ අනිත් එවුන්ට තියෙන දේසපාලන පක්ෂයක හයියවත් මට නැහැනෙ"

තිළිණ ආපනශාලාවේ කවුළුවෙන් එපිට මහ මග දෙස බලා සිටියි. ඔහුගේ ගිලුණ ඇස් තුළ රැඳී ඇති අඳුර අයෝමාට පෙනෙයි. ඔහුට උපකාර කළ යුතුය යන හැඟීම ඇගේ සිත පීඩාවට පත් කරයි.

අයෝමාට තිළිණගේ මව කීප වතාවක් හමුවී ඇත. පළමු වතාවේ හමුවූයේ තිළිණ-ගේ තාත්තාගේ මළගමට ගිය දා ය. කෙසඟ කුඩා සිරුරින් යුතු ඒ මව ඇය වැළඳගෙන හැඬූ හැටි සිහිවන විට පපුව මත මහ බරක් තැබූ කළෙක මෙන් වේදනාවක් දැනෙයි. ජීවිතයේ කිසිදාක සැනසුමක් නොලද ඒ මවට සිය එකම පුතු අධ්‍යාපනය කඩාකප්පල් කරගත් මිනිසකු ලෙස ගමට එනු දැකීමේ අවාසනාව කෙසේ විඳ දරා ගත හැකි වේද?

අයෝමා සුසුමක් හෙළයි.

"මං මොකක් හරි කරලා උඹව ආපහු ඇතුළට ගන්නං.." ඕ දැඩිව කියයි. ඔහු ඇය දෙස බලන්නේ පුදුමයෙනි.

"පිස්සු… ඔයා මක්කරන්නද..?"

"මං මොකක් හරි කරන්නං.. උඹේ ජීවිතේ විනාසවෙනවා දකින්න මට බැහැ.. ඒ නිසා මං මොකක් හරි කරන්නං.. මං කවදාවත් කාගෙ න්වත් යමක් ඉල්ලපු ගෑණියෙක් නෙවෙයි.. ඒත් උඹ වෙනුවෙන් මං ඒ ප්‍රතිපත්තිය කඩන්නං.. පිරිමියෙකුට කරන්න බැරි ගොඩක් දේ ගෑණියෙකුට කරන්න පුලුවන්.. මාව විශ්වාස කරපං.."

ලබන කලාපයට




අපේ ගෙය ඉදිරිපිට සාදාගෙන යන ගෙය මහත්තයා මාමා-ගේය. කබොක් ගලින් බැඳ එක පැත්තක කඩ උළුවස්ස තබා ගොඩනගා තිබිණි. ඇතුළත සුදුහුනු පිරියම් කොට, දොරලෑලි ද දමා තිබුණත් ගෙය සම්පූර්ණයෙන් ම වැඩ අවසන් ව නොතිබිණි. හුනු අනා තැබීම සඳහා එක් පසෙක මැද අඩි තුනේ තුනේ ප්‍රමාණයක තරමට වළක් සාදා ඒ වටේ ලෑලි ගසා තිබිණි. පොළොවට සිමෙන්ති දමා නොතිබිණි. ස්ථිර වශයෙන් කිසිවකු පදිංචි ව නො සිටියත් රාත්‍රී කාලයට කවුරු හෝ පිරිමි කීප දෙනෙක් නැවතී සිටිය හ. ළඟදී පෙන්වීමට බලාපොරොත්තුව සිටින නාට්‍යය පුහුණු වූයේ මෙම ගෙය තුළ ය. මටත්, පියතිලක බාප්පාටත්, චන්ද්‍රදාසටත් මෙම නාට්‍යය පුරුදුවෙන තැනට ගොස් බලා සිටීමට අවසර තිබිණි. මාටින් බාප්පලාගේ කරුණාසේන අයියාත් නිතරම වාගේ පැමිනුණි. දිනපතා ම පුහුණු වන නාට්‍යය අපි හැමදාමත් බලන්නෙමු. කඩ උළුවස්ස දමා තිබූ පැත්තේ දොරලෑලි වසා තිබුණු අතර නාට්‍යය පුහුණු වූයේ ඒ පැත්තේ ය. පුහුණුවට ගෙනැවිත් තිබුණු සර්පිනාව අතින් අවාන පදවන ආකාරයේ එකකි. අප කවුරු හෝ සර්පිනාවට පිටුපසින් සිට අවාන පැදවීම පහසුවක් නිසා එය පැදවීමට අප දෙතුන් දෙනාම එකවිට ඉදිරිපත් වූවත් අවස්ථාව ලැබෙන්නේ ඒ අවස්ථාවේ වැඩි ශක්තියක් යොදන පුද්ගලයාට ය. ඉන් පිටවන සංගීතය ක්‍රමාණුකූල රිද්මයකට පරිවර්තනය කොට ගීතයක් ගායනය අරඹන්නේ සර්පිනාව ඉදිරිපිට සිටින පුහුණු ශිල්පියා ය.

# පෙම් සටන

''දන'නො' බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්දා'' ගීතයේ අනුවාදයෙන් සැමදාම සර්පිනාව ඇරඹිණ. එය නාට්‍යයට අදාළ ගීතයක් නො වූවත්, පළමුව එම ගීතය ම වාදනය කරන්නේ ආගම සිහිපත් කර යමක් පටන් ගැනීමේ වැදගත් කම රකිමින් බව දූන් මට සිතාගත හැකි ය.

පුහුණුවන කාලයේ දී කවදාවත් නාට්‍යය අවසන්වන තුරු බලන්නට මට බැරි විය. එයට හේතුව නාට්‍යය තරමක් දුරට පුහුණු වන විට මට නින්ද යන බැවිනි. නාට්‍ය අතර තුර එම ගෙදර දී මට නින්ද ගියත්, මා උදේට ඇහැරෙන්නේ අපේ ගෙදර දී ය. මට නින්ද ගිය පසු කවුරු හෝ ඔසවා ගෙන අපේ ගෙදරට ගෙනැවිත් තබන හෙයිනි.

''පෙම්සටන'' තුළින් ගමේ බොහෝ දෙනෙකුගේ සැඟවුණු දක්ෂතා මතු කළ බව සඳහන් කළ හැකි ය. මගේ මතකයේ හැටියට සහ කීප දෙනෙකුගේ මතකය අවදි කිරීමෙන් ලබා ගත් කරුණු අනුව මෙම නාට්‍යයේ පීතර හෙට්ටිආරච්චි, ටී. ඇල්. ඩී. ප්‍රේමතිලක, ඇලඩින්, ඩයිලියස්, සෝමදාස, හේමන්ත කන්නන්ගර, චන්ද්‍රරත්න බමුණුසිංහ, හේමපාල මුදලිගේ යන මහත්වරුන්ගේ නම් කීපය සඳහන් කළ හැකිය. නාහල්ලේ ඩයිලියස් විජේරත්න නමැති අයෙක් විකට ජවනිකාවක් රඟපෑ අතර පොකුණුවිට පළාතේ ගැහැණු ළමයින් දෙදෙනෙක් ද රඟපෑ බව මතකය කියයි. ''පෙම් සටන'' හි අපේ මාමා ද පොලිස් නිලධාරියකු වශයෙන් රඟපෑවේ ය. සර්පිනාව ගැසුවේ කන්දා නමැති ද්‍රවිඩ පුද්ගලයෙකි.

මුද්‍රණය කරන ලද විශාල ප්‍රමාණයේ පෝස්ටරයක් ගමේ මෙන් ම අවට ගම්වලද ප්‍රදර්ශනය වෙමින් නාට්‍ය පෙන්වන බව සංනිවේදනය කොට තිබිණි. එහි ඉහළින් ම නොමිලේ! නොමිලේ!! නොමිලේ!!!'' යනුවෙන් මුද්‍රණය කොට තිබුණු අතර නාට්‍යයේ නම ''පෙම් සටන'' යනුවෙන් ලොකු අකුරින් මුද්‍රණය වී තිබිණි. නාට්‍ය පෙන්වන ස්ථානය සහ දිනයද සියලු ම නළු නිළියන්ගේ නම් ද තිබුණු අතර අවසානයේ එන්න. නරඹන්න. ප්‍රීතිවන්න'' යනුවෙන් තරමක ලොකු අකුරින් මුද්‍රණය වී තිබුණා මතක ය. පාර දෙපස සියලුම ගස්වල ද, තාප්පවල ද ළඟ ළඟ ම පොස්ටර් අලවා තිබුණි. මුලු ගම ම නාට්‍ය පිළිබඳව දැනුවත් ව සිටියත් වඩ වඩාත් ප්‍රචාරක කටයුතු ද කෙරිණි. නාට්‍යයට කලින් දවසේ සිට ම ශබ්ද විකාශන යන්ත්‍රයක් බඳින ලද කාරයක් අවට ගම්වල ද ප්‍රචාරය කෙරිණි. මාටින් බාප්පලාගේ ගෙය ළඟ නවතන කාරය එතැන ප්‍රචාරය කිරීමෙන් පසු ව, ඊ ළඟට උඩහ කඩය අසල නවතා කෑ ගසයි. ඊ ළඟට පහළ කඩය ළඟ ය. නැවත නාට්‍යය පෙන්වන පාසල ළඟ තවතා ප්‍රචාරය කරයි. එතැන දෙතුන් විටක් ම ප්‍රකාශ කෙරෙන අතර, රෝමානිස් ආතලාගේ නිවසඅමරදාසත් සිරිපාලත් දෙදෙනා මගේ එක කකුලක බොරු කකුලක් බැඳ අවසන් වූවා පමණීගමේ පිරිස අවස්ථ ානුකූලව යොදා ගතහැකි මෙවන් "අහිංසක ප්‍රයෝග" කොතෙකුත් ඇත.

මම මා අසල, අක්කර අට අසල සහ තොටුපළ අසල කාරය නවතා ප්‍රචාරක කටයුතු කෙරිණි. උඩහ කඩයේ සිට තොටුපළට කිලෝ මීටරයක පමණවත් දුරක් නැති නමුත් ප්‍රචාරක කටයුතු ඉතා පුළුල් අන්දමින් සිදුවිණි.

නාට්‍ය පෙන්වන ස්ථානය ඉහළ කරන්නාගොඩ ප්‍රාථමික පාඨශාලාවයි. එක ම එක දිග ශාලාවකින් යුතු එම මහා ගොඩනැ-ගිල්ල ප්‍රතාපවත් බවක් උසුලයි. එක් පැත්තක වේදිකාව ය.

නාට්‍ය පෙන්වන දවසේ උදේ පාන්දරින් ම ඉස්කෝල වත්තේ සවිකර තිබුණු ශබ්ද විකාශන වලින් ජනප්‍රිය ගීත රාශියක් විකාශන ය වෙමින් තිබිණි. ඒ අතර කොළ කඩ කඩ බොරුවට දෙනවා, පෙම් කැකුල පිපී, සරා ගොයිය හරි මිනිහා, මෙන්න සුදෝ ගන්නකො ඔය දෑත, ජීවන මේ ගමන සංසාරේ, සකල බුජං කොටකලිසන්, ආදී ගීත ප්‍රචාරය විණි. එක ගීතයකින් පසු නාට්‍යය ගැන ප්‍රචාරක දැන්වීමකි. නැවත ගීතයකි. මේ ආකාරයෙන් දවස පුරා ම ශබ්ද විකාශනය තොරතෝංචියක් නැතිව මොරදුන් අතර එම ගීත වලට අපි දුව පනිමින් නැටුවෙමු.

සවස්වන විට ඉස්කෝල වත්ත එක ම සැණකෙළි බිමකි. එක තැනක ඔරෙන්ජ් බාර්ලි විකුණන කඩයකි. එහි සිටින වෙළෙන්දා පිත්තල හැන්දක් බෝතල් දිගේ අදින විට එන ශබ්දය මිහිරි ය. එය ටොනික් විකිණීමට තිබෙන බව සංනිවේදනය කිරීමකි.

රතුපාට බෝතල් කීපයක්, වීදුරු කීපයක් සහිත බේසමක් තැබූ කඩ ලෑල්ල ළඟ කසඇට සරුවත් විකුණන මුදලාලි ය. සරුවත් එකක් සත දහයට සහ පොඩි සරුවත් විදුරුවක් සත පහට විකුණුවා මතක ය. ඔහු කසඇට දමා සරුවත් පැණි එක්කොට වතුර කලවම් කොට සරුවත් එකක් වත් කරන විට එක අතක් ඉතාමත් ඉහළට ඔසවා අනිත් භාජනයට සරුවත් දමමින් කලවම් කරන ආකාරය දෙස අපි පුදුමයෙන් බලා සිටින්නෙමු.

ලබන කලාපයට